අඹගමුව ප්‍රාදේශීය සභාව - 2023

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඹගමුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.1 ඡේදයේ (ආ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ස්ථාවර තැන්පතු රු.19,330 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණු අතර පාරිභෝජ්‍ය ද්‍රව්‍ය රු.15,820 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

1.6.2. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් රු.3,000,511 ක ලී බඩු හා සවි කිරීම් | ලේඛන ඉදිරියේදී නිවැරදි කරන බව. | ලේඛන යාවත්කාලීන කළ යුතුය. |

හා රු.3,156,045 ක කාර්යාල උපකරණ වලට අදාළ උපලේඛන ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| i. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 140 (1) වගන්තිය | වසර 13 කින් නව ඉදිකිරීම් සඳහා වරිපනම් තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි. | ගාස්තු අය කර ගැනීම සිදු කරන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය | සභා බල ප්‍රදේශයේ වෙන්දේසියේ විකුණන ලද ඉඩම් 03 ක බිම් කට්ටි 41 කින් විකුණුම් මත අයකර තිබුණු සියයට 1 බදු රු.427,541 ක් අයකර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගන්නා බව. | හිඟ ආදායම් රැස්කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2015 වර්ෂයේ සිට පැවත එන රු. 406,976 ක කාලය ඉකුත් තැන්පතු 13 ක් නියාදනය කර නොතිබුණි. | උපදෙස් සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,940,598 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,894,414 ක් විය

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,589,000 | 3,797,102 | 3,790,773 | 1,849,334 | 5,830,000 | 3,904,609 | 3,912,126 | 1,843,006 |
| (ii) | කඩ කුලී | 10,373,100 | 3,164,529 | 3,452,798 | 1,821,958 | 12,604,000 | 3,519,726 | 3,619,364 | 2,110,227 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,551,000 | 4,367,618 | 4,000,948 | 549,090 | 1,751,000 | 1,807,338 | 1,807,339 | 182,420 |
| (iv) | වෙනත් ආදායම් | 132,300,620 | 23,182,500 | 55,119,761 | 19,490,669 | 105,815,221 | 24,000,000 | 19,325,222 | 51,427,930 |
| | | 149,813,720 | 34,511,749 | 66,364,280 | 23,711,051 | 126,000,221 | 33,231,673 | 28,664,051 | 55,563,583 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 893,497 ක හිඟ වරිපනම් බදු ශේෂයන් පැවති අතර එයින් රු 406,171 ක් වසර 10 කට වැඩි කාලයක සිට වරිපනම් පරිශ්‍ර 57 කින් අයවිය යුතුව පැවතිණි. වරිපනම් පරිශ්‍ර 30 කින් වසර 05 ත් 10 ත් අතර හිඟයක්ද වසර 01 ත් 05 ත් අතර හිඟ හිටි වරිපනම් පරිශ්‍ර 149 කින් රු.363,473 ක්ද අයවිය යුතුව පැවතියද හිඟ වරිපනම් අය කර නොතිබුණි. | දේපල තහනම සඳහා යොමු කර අවශ්‍ය නීතිමය කටයුතු සිදු කර එම හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අය කළ යුතුය. |

(ආ) කුලී
------

| | | | |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂවලට අදාළ රු.467,401 ක කඩකුලී අයවිය යුතුව පැවති අතර වසර 05 ත් 10 ත් අතර කඩකුලී හිමියන් 15 දෙනෙකුගෙන් රු.208,795 ක්ද, වසර 01 ත් 05 ත් අතර කඩකුලී හිමියන් 04 දෙනෙකුගෙන් රු.245,095 ක්ද, අයවිය යුතුව පැවතුණි. | කඩිනමින් අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ටෙන්ඩර් කරන ලද දේපලවලින් වසර 03 සිට වසර 14 ක කාල පරාසයක සිට පුද්ගලයින් නව දෙනෙකුගෙන් රු. 1,066,644 ක හිඟ ශේෂයක් අයකර නොතිබුණි. | ඒක පාර්ශ්වීය නඩු තීන්දුවක් ප්‍රකාශයට පත් කිරීමට නියමිත බව | - එම - |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,467,828 ක් හා මුද්දර ගාස්තු රු.18,022,841ක් විය. | හිඟ ඉදිරියේදී අයකිරීමට කටයුතු කරන බව. | ආදායම් ගෙන්වා ගත යුතුය. |

(ඇ) වෙනත් ආදායම්
--------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දැන්වීම් පුවරු 56 කට අදාළව රු.119, 865 ක ආදායමක් බිල් කර නොතිබුණු අතර බිල් කර තිබු දැන්වීම් පුවරුවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු 22 ක් සඳහා රු.220,192 ක් අයකර නොතිබුණි. | අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව | ආදායම් අයකළ යුතුය. |

03. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.
---------------------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 ඡේදය අනුව සභාව සතු මාර්ග ගැසට් පත්‍රයේ එලකර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරණ ගැසට්පත්‍රයේ පලකළ 2000 අංක 53 සහ 1988 අංක 56 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත අනුව සමාලෝචිත වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 12ක් සඳහා රු.27,000 ක බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ව්‍යාපාර 04 ක් වසා ඇති අතර 01 ක් තහනම් කර ඇත. අනෙකුත් බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමින් පවතින බව | පනතේ නියමයන් ප්‍රකාරව නියාමන කටයුතු කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 (ආ) හා 52 ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර ලබා නොගෙන සිදුකළ ඉදිකිරීම් 10 ක් සම්බන්ධයෙන් ගාස්තු අයකර ගැනීමට හෝ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | හිමිකරුවන් දැනුවත් කොට එම ඉදිකිරීම් නීත්‍යානුකූල කිරීමට පියවර ගන්නා බව | ගාස්තු අය කර ගැනීමට හෝ අනවසර ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 49 (අ) වගන්ති අනුව ප්‍රාදේශීය සභා පාරක ගොඩනැගිලි සීමාව තුළ සිදු කරන ඉදිකිරීමකදී නිර්වන්දි ගිවිසුමකට අදාළ පාර්ශවය සභාව සමඟ එළඹිය යුතු වුවද, පරීක්ෂාවට ලක් වූ ලිපිගොනු 14 හි කිසිදු පාර්ශවයක් සමඟ සභාව විසින් නිර්වන්දි ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | සභාව විසින් නිර්වන්දි ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරන බව | නිර්වන්දි ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉඩම් වර්තමාන හිමිකාරිත්වය අයදුම්කරුට පවතින බවට සනාථ කර ගැනීමකින් තොරව ගොඩනැගිලි අයදුම්පත් 14 ක් අනුමත කර තිබුණි. | ලියාපදිංචි කරනු ලබන සෑම ගොඩනැගිලි අයදුම්පත් ගොනුවකටම පත්තිරු සටහන් ඇතුළත් කර ගන්නා බව | හිමිකාරිත්වය තහවුරු කළ යුතුය. |
| (ඈ) | වසර දෙකකට පෙර සිට ඉදිරියට ගෙන එන රු.1,650,225ක ණය ශේෂ 27 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාත් නිරවුල් කර නොතිබුණි. | නිළධාරීන්ගේ තොරතුරු සොයා ගැනීම සඳහා ඔවුන් අවසන් වරට සිටි සේවා ස්ථාන වෙත ලිපි යොමු කර ඇති බව | නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | 1995 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළ රු.1,715,734 ක අත්තිකාරම් ගිණුම් ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නිරවුල් කර නොතිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේ දී මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව | නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ගලි බවුසරයේ ලියාපදිංචි සහතිකය අනුව දක්වා තිබුණු වැසි අංකයට පරස්පර අංකයක් එන්ජිමෙහි පැවතීම හේතුවෙන් අක්‍රමිකතාවයක් සිදුවීමේ ඉඩ කඩ බැහැර කළ නොහැකි විය . | පරිගණක දත්ත පද්ධතිය අනුව පරික්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව | වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ පලකළ නාගරික සංවර්ධන අධිකාරි පනතේ සංශෝධනය අනුව 23 (1) හා (2) වගන්තිවලට අනුව අනුබෙදුම් කර වෙන්දේසියේ විකුණන ලද ඉඩම් වලින් සභාවේ පොදු කටයුතු සඳහා ලබා දී තිබුණු පර්චර්ස් 1083 ක ඉඩම් කොටසක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | සභාව වෙත ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
---------------------------------------
පාරිසරික ගැටලු
------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ඉඩමක් හඳුනා නොගැනීම හේතුවෙන් මස්කෙළිය ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරන රිකාටන් කසළ අංගනයට කසල බැහැර කිරීම සිදුකර තිබුණි. මේ හේතුවෙන් කසල කළමනාකරණය නිසි ලෙස සිදු කිරීමට නොහැකිව තිබුණි. | හඳුනාගත් ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නිදහස් කිරීමට කටයුතු කර නොමැති බව. | කසළ කළමනාකරණය නිසි ලෙස ඉටු කළ යුතුය. |